**ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය - 2023**

**-------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 2 කොටසෙහි 27 ඡේදය පරිදි 2023 වර්ෂයේ ආදායම වූ රු.2,575,925 ක වටිනාකම තුල 2023 වර්ෂයේදී පවත්වා නොමැති පාඨමාලාවන් සඳහා බාහිර පාර්ශවයකින් ලද රු.2,504,000 මුදලක් ඇතුලත්ව තිබූ අතර මේ හේතුවෙන් ප්‍රවර්ථන වර්ෂයේ ලාභය රු.2,504,000 කින් අධිතක්සේරු වී තිබුණි. | රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවෙන් පාඨමාලා ගාස්තු සඳහා ලද රු.2,575,925 ක ගාස්තුවට අදාළ පාඨමාලාවන්ගෙන් සියයට 90 ක් 2023 වර්ෂය අග භාගයේදී ආරම්භ කරන ලද අතර ඉතිරි පාඨමාලා 2024 වර්ෂයේ මුල් භාගයේදී ආරම්භ කරන ලදි. | අදාළ ප්‍රමිතයට අනුකූලව ආදායම උපලබ්ධි වන අවස්ථාවේදී හඳුනාගත යුතුය. |
| ආ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිත වල 17 කොටසෙහි 15C ඡේදය පරිදි, සමාලෝචිත වර්ෂයේ ප්‍රත්‍යාගණන අතිරික්තය වූ රු.2,034,211 ක අගය වෙනත් විස්තීරණ ආදායම යටතේ දක්වා නොතිබුණි. | සටහන් කරගන්නා ලදී. | අදාළ ප්‍රමිතයට අනුකූලව ප්‍රත්‍යාගණන අතිරික්තය වෙනත් විස්තීරණ ආදායම යටතේ දැක්විය යුතුය |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය විසින් පවත්වා ඇති පාඨමාලා වෙනුවෙන් අයවිය යුතු ශේෂය රු.20,131,190 ක් සමාලෝචිත වර්ෂයේදී ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වසරක් පාසා ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලාවන් පවත්වාගෙන යන අතරතුර පාඨමාලාවන් හැර යන ශිෂ්‍ය/ ශිෂ්‍යාවන් ප්‍රතිශතයක් වශයෙන් ගත් කළ වසරකට 15 ක් පමණ ප්‍රමාණයකි. | හිඟ ආදායම් නොපමවා අයකර ගැනීමට කටයුතු කළ යුතුය |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මූ.රෙ. 395 | මුදල් රෙගුලාසි ප්‍රකාරව, ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන බැංකු ගිණුමකට අදාළව මාසික බැංකු සැසඳුම් ප්‍රකාශන සකස්කර විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මේ සම්බන්ධව දැනුවත් වී නොතිබුණු අතර ඉදිරියේ දී මෙම බැංකු සැසඳුම් ප්‍රකාශ විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| ආ) මූ.රෙ. 756 | මුදල් රෙගුලාසි ප්‍රකාරව, වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි | මේ වනවිට වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව සකස් කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සිදුකළ යුතුය. |
| ඇ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 21 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 09/2022 | චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූල නොවන පරිදි 2022 වර්ෂය සඳහා රු.511,250 ක් ප්‍රසාද දීමනා ලෙස ගෙවා තිබුණි. | මෙම ප්‍රසාද දීමනා ගෙවා ඇත්තේ මෙහෙයුම් ඉතුරුම්වලිනි. මෙම ප්‍රසාද දීමනා ගෙවීම සඳහා ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| ඈ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(1) සහ 40(2) උපවගන්ති | විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව, ආයතනයේ අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර නොතිබුණි. | ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ ගණකාධිකාරිවරයෙකු හෝ අභ්‍යන්තර විගණකවරයෙකු සඳහා තනතුරු පිහිටුවා නොමැත ස්ථිර සේවයට බඳවා ගැනීමට සිදු වුවහොත් මෙම තනතුරු වෙනුවෙන් වැටුප් හා වේතන සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදුවේ. | ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව අභ්‍යන්තර විගණකවරයෙකු පත්කළ යුතුය. |
| ඉ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41(1) සහ 41(2) උපවගන්ති සහ 2021 නොවැම්බර් | අදාල විධිවිධාන ප්‍රකාරව, ආයතනයේ කටයුතු සිදු කිරීම සඳහා විගණන හා කළමනාකරණ කමිටුවක් පත්කර නොතිබුණි. | ආයතනයට ඵලදායී නොවන වියදම් පිළිබඳව පාලක මණ්ඩලය සැලකිලිමත් විය යුතු බව පාලක මණ්ඩලයේ නිගමනය විය. | ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව, විගණන හා කළමනාකරණ කමිටුවක් පත්කළ |

| | | | |
|---|---|---|---|
| 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 ඡේදය. | | | යුතුය. |
| ඊ) 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයේ පස්වන පරිච්ඡේදයේ ඇමුණුම 01 | මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව, වර්ෂයට අදාලව ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPI) හඳුනාගෙන ඒවා ඇගයීම් කර ඉන් ඉටුකරගත් ප්‍රමාණය කොපමණද යන්න (outcome) පරීක්ෂාකර නොතිබුණි. | කාර්ය සාධක දර්ශක සහ ප්‍රතිඵල සම්බන්ධව කාර්තුවකට වරක් අමාත්‍යාංශයේ පැවැත්වෙන ප්‍රගති සමාලෝචන රැස්වීමේ දී වැඩිදුරටත් සාකච්ඡා කෙරේ. | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත්කරන ලද මාර්ගෝපදේශය ට අනුකූලව හඳුන්වා දී ඇති කාර්යසාධන දර්ශක ඇගයීම් කර ඉටුකරගත් ප්‍රමාණය දැක්විය යුතුය |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.23,967,654 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.10,817,092 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.13,150,562 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට කෙටිකාලීන ආයෝජනයන්ගෙන් ලද පොලී ආදායම රු.9,214,121 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය විසින් 2022 වර්ෂයේ පවත්වන ලද පාඨමාලා 5 ක් 2023 වර්ෂයේදීද පැවැත්වීමට කටයුතු කර තිබුණද, 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ දී එක් එක් පාඨමාලාව සඳහා සහභාගි වූ සිසුන් ප්‍රමාණය සියයට 22 සිට සියයට 85 දක්වා අඩුවී ඇති අතර 2022 වර්ෂයේදී පැවැත්වූ පාඨමාලා අතරින් පාඨමාලා 5ක් 2023 වර්ෂයේදී පවත්වා නොතිබුණි. | මුද්‍රණ ක්ෂේත්‍රයේ තෝරාගත් විෂය පථයන්ට එම වකවානු තුල ඇතිවන ඉල්ලුම අනුව ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය පවත්වන සමහරක් මුද්‍රණ පාඨමාලා පවත්වන්නේ වසර දෙකකට එක් වරකි. | ආයතනයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා ප්‍රමාණවත් කාර්යයභාරයක් සැලසුම්කර ක්‍රියාත්මක කල යුතුය. |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අ) 2017 නොවැම්බර් 01 සිට 2024 ඔක්තොබර් 31 දක්වා වසර 7 ක කාලයක් සඳහා අවස්ථා 4ක දී, ආයතනයේ විශ්‍රාමික ලේඛකාධිකාරීවරයා අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව කොන්ත්‍රාත් පදනම මත ප්‍රධාන විධායක නිලධාරී තනතුරට පත්කර වසර 6කුත් මාස 2ක කාලයක් සඳහා ඔහුගේ වැටුප් හා දීමනා වෙනුවෙන් රු.10,210,000 ක් ද, ඉන්ධන දීමනාව ලෙස රු.3,731,668 ක් සහ වාහන නඩත්තු දීමනා ලෙස රු.1,200,000 ක් වශයෙන් එකතුව රු.15,141,668 ක් අදාළ කාලය තුළ ආයතනය විසින් ගෙවා තිබුණි. | මෙම විශ්‍රාමික නිලධාරියා ආයතනයේ උන්නතිය උදෙසා තවදුරටත් මෙම තනතුරේ තබා ගත යුතු බවට පාලක මණ්ඩලය තීරණය කරන ලදී. ඒ අනුව ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාලක මණ්ඩලයේ අනුමැතියට යටත්ව අදාළ නිලධාරියාගේ සේවය දීර්ඝ කර ඇත. මේ සම්බන්ධව අමාත්‍යාංශයේ ලේකම් දැනුවත් කර ඇත. | නිසි අනුමැතින් සහිතව අදාළ තනතුර සඳහා නිලධාරීන් පත්කිරීමට කටයුතු කළ යුතුය. |
| ආ) 2023 මාර්තු 01 සිට 2024 පෙබරවාරි 28 දක්වා වසරක කාලය සඳහා ආයතනයේ විශ්‍රාමික නිලධාරියෙකු අධ්‍යයන අධ්‍යක්ෂ තනතුර සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව වසරක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත පත්කර මාස 10ක් සඳහා ඔහුගේ වැටුප් හා දීමනා වශයෙන් රු.1,500,000 ක් ආයතනය විසින් ගෙවා තිබුණි. | ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පනතට අනුව 18 (අ) වගන්තියේ බලතල ප්‍රකාරව පාලක මණ්ඩලය විසින් මෙම පත් කිරීම සිදු කර ඇත. | නිසි අනුමැතින් සහිතව අදාළ තනතුර සඳහා නිලධාරීන් පත්කිරීමට කටයුතු කළ යුතුය. |